# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2085/8 - 2018 අගෝස්තු මස 21 වැනි අඟහරුවාදා - 2018.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2015 සැප්තැම්බර් මස 21 වැනි දිනැති අංක 1933/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලදුව වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2018 අගෝස්තු මස 21 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2018 අගෝස්තු මස 21 වන දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලය.

**උපලේඛනය**

(1) එම නිවේදනයෙහි "(අංක 16) අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි දැක්වෙන 3 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි 2 වැනි අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

3. ශ්‍රී ලාංකික පුරවැසිභාවයට අදාළ කටයුතු

(ඇ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "උදර්පණ නීතිය (1977 අංක 8)" ඉවත් කිරීමෙන් ;

1A - G 27786 — 372 (2018/08)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) එම නිවේදනයෙහි "(අංක. 1) ආරක්ෂක අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි දැක්වෙන 13 වෙනි අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන්;

"14. උදර්පණයට අදාළ කටයුතු"

(ආ) එහි I වැනි තීරුවෙහි අයිතම 15 සිට නැවත අංකගත කිරීමෙන්;

(ඇ) එහි III වැනි තීරුවෙහි "සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව සිදුකරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩ පැවැත්වීම පනත (2000 අංක 42)" යන්නට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන්;

"උදර්පණ නීතිය (1977 අංක 8)"